# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2316/20 - 2023 ජනවාරි මස 24 වැනි අඟහරුවාදා - 2023.01.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**සබරගමුව පළාත් සභා නිවේදනය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තියෙන් හා 223 වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාතේ ආණ්ඩුකාරවර ටිකිරි කොබ්බෑකඩුව වන මා විසින් සාදන ලද පහත සඳහන් නියෝග මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ටිකිරි කොබ්බෑකඩුව,
සබරගමුව පළාතේ ආණ්ඩුකාරවර.

2023 ජනවාරි මස 24 වැනි දින,
ආණ්ඩුකාර කාර්යාලය,
නව නගරය,
රත්නපුර දී ය.

**නියෝග**

1. මෙම නියෝග සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල්වල හා පටුමාවත්වල ස්ථිර ලකුණු හා සීමා ලකුණු කිරීම ද, සැලසුම් පිළියෙල කිරීමට කටයුතු සැලැස්වීම ද, ඒවායෙහි නාම ලේඛනයක් දක්වමින් දැන්වීම් පළ කිරීමේ කටයුතු සඳහා කාර්යය පටිපාටි නියම කිරීම සඳහා වන නියෝග මාලාව යන නමින් හඳුන්වනු ලැබේ.


1A - PG 6196 — 07 (2023/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 23 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවක් සතුව ඇති ලෙස සලකනු ලැබිය යුතු පාරවල් හා පටුමාවත්, එකී පනතේ 24 වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමට සබරගමුව පළාත තුළ පිහිටි ප්‍රාදේශීය සභාවලට වැඩිදුර කාලයක් සඳහා අවසරදීමට හා එකී පාරවල්වල හා පටු මාවත්වල ස්ථිර ලකුණු හා සීමා ලකුණු කිරීමට ද, එම පාරවල්වල හා පටු මාවත්වල සැලසුම් පිළියෙල කිරීමට කටයුතු සැලැස්වීමට ද, එකී පාරවල්වල හා පටු මාවත්වල නාමලේඛන දක්වමින් දැන්වීම් පළකිරීම ද මෙම නියෝග මාලාවෙන් නියම කර ඇති පටිපාටි අනුව සිදු කළ යුතුය.

3. (අ) 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු මෙහි මින් මතු ''පනත'' යනුවෙන් හඳුන්වනු ලබන, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ, 24 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් සහ 223 වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර, එකී ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය යටතේ වන කාර්යය ඉටු කිරීම සඳහා, මේ නියෝග ක්‍රියාත්මක වන 2023.01.24 දින සිට මාස දොළහක වැඩිදුර කාලයක් සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා වෙත මෙයින් අවසර දෙනු ලැබේ.

(ආ) ඉහත 3.(අ) වගන්තියෙන් වැඩිදුරටත් අවසර දෙනු ලැබූ මාස දොළහක කාලය ඇතුළත ඒ කාර්යය ඉටු කර අවසන් කිරීමට අපොහොසත් වන, මෙහි මින් මතු ''සභාව'' යනුවෙන් හඳුන්වනු ලබන සබරගමුව පළාතේ යම් ප්‍රාදේශීය සභාවකට, ඒ කාර්යය ඉටු කර අවසන් කිරීම සඳහා තවදුරටත් කාලය අවශ්‍ය වන්නේ නම් ඊට හේතු වූ විශේෂ අවස්ථානුගත කරුණු ඉදිරිපත් කර, තවත් වැඩිදුර කාලයක් සඳහා අවසර ඉල්ලා සිටීමට හැකි අතර, එකී කාලය 2023.01.24 දින සිට වසර 2ක් (දෙකක කාලයක්) නොඉක්මවන කාලයක් විය යුතුය.

4. (අ) පනතේ 23 වන වගන්තිය යටතේ, සභාව සතු වී ඇති ලෙස සලකනු ලැබිය යුතු, මෙහි මින් මතු ''පාර'' යනුවෙන් හඳුන්වනු ලබන පාරවල් හා පටුමාවත් හඳුනාගෙන, එකී පාරවල් හා පටුමාවත් පිළිබඳ නාම ලේඛනයක් පිළියෙල කිරීම සභාවේ කාර්යය විය යුතුය.

(ආ) පනතේ 16 වන වගන්තිය යටතේ හෝ 17 වන වගන්තිය යටතේ සභාවට පැවරුණු, නිශ්චල දේපළ අතරට ඇතුළත් වී ඇති සියලුම පාරවල් හා පටුමාවත් ද, 4 (අ) නාමලේඛනයේම ඇතුළත් කිරීමට සභාව විසින් ක්‍රියාකරනු ලැබිය යුතුය.

5. (අ) 4 (අ) අනුව සකසා ඇති නාමලේඛනයේ සඳහන් සෑම පාරක්ම වෙනුවෙන් මෙහි 01 වන උපලේඛනයේ ආකෘතිය අනුව හඳුනාගැනීමේ කේත අංකයක් බැගින් වෙන් කළ යුතුය.

(ආ) හඳුනා ගැනීමේ කේත අංකයක් වෙන්කළ සෑම පාරකම, පහත සඳහන් තොරතුරු සහ ඊට අදාළ භූගෝලීය ඛණ්ඩාංක දත්ත රැස්කර ගැනීමට විධිවිධාන සැලැස්වීම සභාවේ කාර්යය විය යුතුය.

I. ආරම්භක ස්ථානය සම්බන්ධවන වෙනත් යම් පාරක නම හා එම ආරම්භක ස්ථානයේ වම් පස හා දකුණු පස භූගෝලීය ඛණ්ඩාංක සටහන් කිරීම.

II. එකී පාරට සම්බන්ධ වන වෙනත් යම් පාරෙහි සිට, එකී පාර විහිදී යන්නේ වම් පසට ද නැතහොත් දකුණු පසට ද වග තහවුරු කර ගැනීම.

III. පාරෙහි ආරම්භයේ සිට සරල රේඛාවක ස්වරූපය වෙනස්වන සෑම ස්ථානයකම, එකී පාරෙහි වම් පස හා දකුණු පස භූගෙ ෝලීය ඛණ්ඩාංක සටහන් කිරීම.

IV. පාර හරහා ගලා යන ගඟකට, ඇළකට, දොළකට හෝ වෙනත් දිය පාරකට ඉහළින් ඉදිකර ඇත්තේ පාලමක් ද, බෝක්කුවක් ද, පෙට්ටි බෝක්කුවක් ද, දිය පැන්නුමක් ද නැතහොත් ඒදණ්ඩක් ද යන වග හා ඒවායෙහි පිහිටීම පෙන්නුම් කරන භූගෝලීය ඛණ්ඩාංක සටහන් කිරීම.

V. පාරෙහි ආරක්ෂාව සඳහා ඉදිකර ඇති යම් පැති බැම්මක් හෝ වෙනත් යම් ආධාරකයක් වේ නම්, එහි ආරම්භක ස්ථානයේ හා අවසන් වන ස්ථානයේ භූගෝලීය ඛණ්ඩාංක සටහන් කිරීම.

VI. පාර ඔස්සේ ඉදිකර ඇති කාණුවල ආරම්භක ස්ථානයේ හා අවසන් වන ස්ථානයේ භූගෝලීය ඛණ්ඩාංක සටහන් කිරීම.

VII. පාර ඔස්සේ සිටුවා ඇති විදුලි කණු අතරින්, වීථි පහන් සවිකර ඇති විදුලි කණු සහ එම ස්ථානවල භූගෝලීය ඛණ්ඩාංක සටහන් කිරීම.

VIII. ආරම්භක ස්ථානයේ සිට අවසන් වන ස්ථානය දක්වා පාර සංවර්ධන කිරීමට යොදාගෙන ඇති මතුපිට තලය කුමක් ද යන්න සහ එම මතුපිට තලය එකිනෙකට වෙනස් වන සෑම ස්ථානයකම භූගෝලීය ඛණ්ඩාංක සටහන් කිරීම.

IX. පාරෙහි දිග මීටර්වලින් සටහන් කිරීම.

X. පාරෙහි සාමාන්‍ය පළල සහ සංවර්ධිත පළල මීටර්වලින් සටහන් කිරීම.

XI. පාරෙහි පළල වෙනස් වන සෑම ස්ථානයකම වම් පස හා දකුණු පස භූගෝලිය ඛණ්ඩාංක සටහන් කිරීම.

6. මේ නියෝග යටතේ පිළියෙළ කරනු ලබන සෑම ලේඛනයක් සහ සැලැස්මක්ම, කඳවල/ශ්‍රී ලංකා යන බණ්ඩාංක ව්‍යුහයට අයත් භූගෝලීය බණ්ඩාංක භාවිත කරමින් පිළියෙල කළ යුතු ය.

7. 4 (අ) නාම ලේඛනයේ දැක්වෙන පාරවල් සම්බන්ධයෙන් රැස්කර ඇති දත්ත ආශ්‍රයෙන් දෙවන උපලේඛනයෙහි ආකෘතියට අනුව, සැලැස්මක් පිළියෙල කිරීම සභාවේ කාර්යය විය යුතු ය.

8. මෙහි තුන්වන උපලේඛනයේ ආකෘතියට සාරානුකූලව, සෑම පාරක්ම පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයක් පිළියෙල කිරීමට විධිවිධාන සැලැස්වීම සභාවේ කාර්යය විය යුතුය.

9. (අ) 4 (අ) වගන්තිය යටතේ පිළියෙල කරන ලද නාමලේඛනයේ ඇතුළත් පාරවල්, සභාව සතු පාරවල් වශයෙන් පිළිගැනීමට පනතේ 24 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ සභාව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කළ යුතුය.

(ආ) (අ) වන වගන්තිය යටතේ සභා තීරණය ගැනීමෙන් පසුව, තුන්වන උපලේඛනයට සාරානුකූලව එම පාරවල්වල නාමලේඛනයක් ඇතුළත් දැන්වීමක් *ගැසට් පත්‍රයේ* පළකිරීම සභාවේ කාර්යය විය යුතුය.

(ඇ) *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන එකී දැන්වීමෙහි ඇතුළත් යම් පාරක අයිතිය සම්බන්ධ හිමිකම් කියන යම් පාර්ශවයක් වේ නම්, පනතේ 24 වැනි වගන්තියේ (2) උපවගන්තියේ විධිවිධාන යටතේ ක්‍රියා කිරීමට එකී පාර්ශවයකට හිමිකම් තිබිය යුතුය.

10. (අ) 9 (ආ) යටතේ වන දැන්වීමක් *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසුව, එවැනි යම් දැන්වීමක ඇතුළත් කිසියම් පාරක අයිතිය සම්බන්ධයෙන් නිසි අධිකරණයක පවරනු ලැබ ඇති නඩු සම්බන්ධ තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා ගැනීම සභාවේ කාර්යය විය යුතුය.

(ආ) යම් තැනැත්තෙකු විසින් 9 (ආ) යටතේ පළ කරන ලද දැන්වීමකට අදාළව අධිකරණයේ නඩුවක් පවරා ඇති බවට එම අධිකරණය විසින් සභාවට නොතීසියක් මගින් දන් වූ වහාම, ඒ නඩුව පිළිබඳ තොරතුරු එකී ලේඛනයෙහි සටහන් කර තැබීමට සහ එකී නඩුව පිළිබඳ අවසාන තීරණය දක්වා සිදුවීම් නඩුවට ගොනු කර ඇති ලිපි ලේඛන හා කාර්යය සටහන්වල ඇතුළත් විස්තර අනුව කලින් කල එකී ලේඛනය යාවත්කාලීන කිරීමට විධිවිධාන සැලැස්වීම ද සභාවේ කාර්යය විය යුතුය.

11. 9 වැනි වගන්තිය යටතේ වන දැන්වීම මගින් නිශ්චිතව නියම කර ඇති අවසාන දිනයට පෙර ඒ දැන්වීමෙහි ඇතුළත් යම් පාරක අයිතිය සම්බන්ධයෙන් නිසි අධිකරණයක පවරනු ලැබ ඇති යම් නඩුවකදී, එකී අධිකරණය විසින් දෙනු ලැබූ තීරණය මත වහාම ඒ පාරෙහි සීමා ලකුණු වෙනස් කිරීම සහ ඒ සැලැස්මෙහි අවශ්‍ය වෙනස්කම් කිරීමට විධිවිධාන සැලැස්වීම සභාවේ කාර්යය විය යුතු අතර, අදාළ අධිකරණ තීරණය ලබා දුන් දිනයේ සිට එම වෙනස් කිරීම් වලංගු විය යුතුය.

12. (අ) 11 වන වගන්තිය යටතේ අවශ්‍ය වෙනස් කිරීම් කරනු ලැබූ පාරවල්; සහ

(ආ) 9 (ආ) වගන්තියේ දැන්වීමට අනුව විරෝධතාවයක් ඉදිරිපත් නොවූ පාරවල්, සභාව සතු පාරවල් ලෙස සැලකිය යුතු බවට සහ එකී පාරවල් පිළිබඳ ලේඛනයක් *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කළ යුතු බවට යෝජනා සම්මතයක් සභාව විසින් ගනු ලැබිය යුතුය.

(ඇ) (ආ) වන වගන්තිය යටතේ වන යෝජනාව සම්මත කිරීම සහ ඒ පිළිබඳව වන දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ කිරීම, 9 වන වගන්තිය යටතේ වන දැන්වීම් පළ කළ දින සිට මාස 3 ක කාලයක් ගත වීමෙන් පසුව සහ මාස 6ක කාලයක් අවසන් වීමට පෙර කළ යුතුය.

(ඈ) 9 (ආ) වගන්තියේ දැන්වීමට අනුව නිසි අධිකරණයක නඩු පවරා තිබූ සහ 12 (ආ) වන වගන්තිය යටතේ වන දැන්වීම පළ කිරීමෙන් පසු එකී අධිකරණය විසින් අවසාන තීරණයක් දී ඇති යම් පාරක් සම්බන්ධයෙන්, එකී අවසාන තීරණය අනුව අවස්ථාවෝචිත පරිදි අවශ්‍ය වෙනස් කිරීම් සිදුකර, එම පාරවල් ඇතුළත් අතිරේක නාමලේඛනයක් සහිත දැන්වීමක් *ගැසට් පත්‍රයේ* පළ කිරීමට සැලැස්වීම සභාවේ කාර්යය විය යුතුය.

13. (අ) 12 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත්කර ඇති දැන්වීමක ඇතුළත් සෑම පාරක්ම, සභාව සතු කරනු ලැබූ පාරක් ලෙස සැලකීම නීත්‍යානුකූල විය යුතුය.

(ආ) සභාව සතු ලෙස සලකනු ලැබූ යම් පාරක්, පනතේ 24 (6) වන වගන්තිය යටතේ පාරක් ලෙස භාවිත කිරීම අවසන් වන කවර හෝ අවස්ථාවක, 12 වැනි වගන්තිය යටතේ පළ කළ දැන්වීමට සංශෝධනයක් පළකිරීම සභාවේ කාර්යය විය යුතුය.

14. සභාව සතු කරනු ලැබූ ලෙස සලකනු ලබන සෑම පාරක් වෙනුවෙන්ම, ඒ පාර සම්බන්ධ තොරතුරු ඇතුළත් කළ ඉලෙක්ට්‍රොනික ලිපිගොනුවක් සහ ඉලෙක්ට්‍රොනික මෘදු පිටපතක් පාරවල් පිළිබඳ ඉන්වෙන්ට්‍රියක් පිළියෙල කිරීම සහ අවස්ථාවෝචිත පරිදි එය යාවත්කාලීන කිරීම සභාවේ කාර්යය විය යුතුය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ නියෝගවල —

''සභාව'' යන්නෙන් සබරගමුව පළාත තුළ පිහිටි ප්‍රාදේශීය සභාවල සියලු කාර්යය කටයුතු, තීරණ, නියමයන් සහ ක්‍රියා සම්බන්ධයෙන් තීරණ ගනු ලබන සභිකයන්ගෙන් සැදුම්ලත් මහා සභාව ද ;

''අමාත්‍යවරයා'' යන්නෙන් සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යවරයා ද ;

''ආණ්ඩුකාරවරයා'' යන්නෙන් සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරවරයා ද ;

''සභාපතිවරයා'' යන්නෙන් සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභාවක ගරු සභාපතිවරයකු ද ;

''පාර'' යන පදයට පනතේ 23 වන වගන්තිය යටතේ සභාව සතු වී ඇති ලෙස සලකනු ලැබිය යුතු පාරක්, මාවතක්, පටුමාවතක්, අඩි පාරක් සහ පඩි පෙළක් ද අදහස් විය යුතු අතර, එවැනි කිසියම් පාරක, මාවතක, පටු මාවතක, අඩි පාරක හෝ පඩි පෙළක, රක්ෂිතය ද ඊට සම්බන්ධ යම් පාලමක්, බෝක්කුවක්, පෙට්ටි බෝක්කුවක්, දිය පැන්නුමක්, පැතිබැම්මක්, බඳින ලද හෝ කණින ලද කාණුවක් හෝ ජිදණ්ඩක් ද ඊට ඇතුළත්ව ඇති සේ ද ;

''පාරක මතුපිට තලය'' යන්නෙන්, ගල් හා තාර මිශ්‍රණයක්, අන්තර් සම්බන්ධිත ගල්, කොන්ක්‍රීට්, ඇස්ෆෝල්ට් කොන්ක්‍රීට් හෝ බොරළු යොදා කරනු ලැබූ සංවර්ධන මාධ්‍යය ද ;

''කඳවල ශ්‍රී ලංකා බණ්ඩාංක ව්‍යුහය'' යන්නෙන්, ඊපීඑස්ජී 5234 කඳවල/ශ්‍රී ලංකා ග්‍රිඩ් (EPSG 5234 Kadawala/Sri Lanka Grid) ද ;

අදහස් විය යුතුය.

16. මේ නියෝගවල සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

## පළමුවැනි උපලේඛනය

5(1) වගන්තිය

### මාර්ග සඳහා කේත අංක වෙන් කිරීම

සභාව සතු විය යුතු ලෙස සළකනු ලබන යම් පාරක් සඳහා වෙන්කර දෙනු ලබන කේත අංකයට පහත කරුණු ඇතුළත් විය යුතුය.

**කේතය :** පළාත/ප්‍රාදේශීය සභාව/පාද රේඛා මාර්ගය (RDA/PRDA)/ පළාත් පාලන ආයතනය සතු පාර/ අතුරු පාර

*උදාහරණ :* **SG/WPS/A4/01/01**

| | | |
|---|---|---|
| SG | - | සබරගමුව පළාත |
| WPS | - | වැලිගෙපොල ප්‍රාදේශීය සභාව |
| A4 | - | කොළඹ - මඩකලපුව මාර්ගය (ප්‍රධාන මාර්ගය) |
| 01 | - | පළමු අතුරු මාර්ගය |
| 01/01 | - | පළමු අතුරු මාර්ගයේ අතුරු මාර්ගය |

- පළාත සඳහා වෙන්කර දෙනු ලබන කේතයට ''SG'' යන්න යොදා ගත යුතුය.
- ප්‍රාදේශීය සභාව සඳහා වෙන්කර දෙනු ලබන කේතය, සබරගමුව පළාත් පාලන කොමසාරිස්වරයා විසින් දෙනු ලබන උපදෙස් අනුව වෙන්කර ගත යුතුය.
- පාද රේඛා මාර්ගය යනුවෙන් අදහස් කරනු ලබන්නේ මාර්ග සංවර්ධන අධිකාරිය හෝ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගයකි. ඒ යම් ආයතනයක් විසින් *ගැසට් පත්‍රයෙහි* ප්‍රකාශයට පත් කළ නිවේදනයක එකී යම් මාර්ගයක් සම්බන්ධයෙන් එකී මාර්ගයට වෙන්කර දී ඇති අංක මේ සඳහා යොදා ගත යුතුය.
- පාරෙහි කේතයේ ඊළඟ අංකය විය යුත්තේ පාද රේඛා මාර්ගයෙන් විහිදී යන මාර්ග අනුපිළිවෙල අනුව වෙන් කරනු ලබන අංකයක් විය යුතුය. මේ අංකය ඉලක්කම් දෙකකින් සමන්විත විය යුතුය.
- මෙහි ''අතුරු පාර'' යනුවෙන් අදහස් කරනු ලබන්නේ, පළාත් පාලන ආයතනය සතු යම් පාරකින් ආරම්භ වී විහිදෙන අතුරු පාරකි. එවැනි අතුරු පාරක් වන විට මෙම කේතයෙහි අවසාන ඉලක්කම් දෙකට අංකයක් නියම කළ යුතුය. අතුරු පාරක් නොවන පළාත් පාලන ආයතනය සතු පාරක් වන විට මෙම අවසාන ඉලක්කම් දෙක ''00'' විය යුතුය.

**දෙවැනි උපලේඛනය**

**7 වන වගන්තිය**

**පාරෙහි සැලැස්ම**

මාර්ග අංකය

මාර්ගයේ නම

උතුර ↑

භාණ්ඩාංක (කඳවල ශ්‍රී ලංකා)

සිතියම

සුචිය

උපලේඛනය

පරිමාණය

දත්ත පදනම :
සකස් කළේ :
දිනය :

අනුමත කළේ :
දිනය :

භාණ්ඩාංක (කඳවල ශ්‍රී ලංකා)

**තුන්වැනි උපලේඛනය**

**8 වැනි වගන්තිය**

| අනු. අංක | පාරෙහි කේතය | පාරේ නම | ආරම්භක ඛණ්ඩාංක (කඳවල/ ශ්‍රී ලංකා) | | අවසාන ඛණ්ඩාංක (කඳවල/ ශ්‍රී ලංකා) | | පාරේ දිග (මීටර්) | පාරේ සාමාන්‍ය පළල (මීටර්) | සංවර්ධිත පළල (මීටර්) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | වම | දකුණ | වම | දකුණ | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

EOG 02 - 0363

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.